කළමණාකරණ සේවා චක්‍රලේඛ - 36

මගේ අංකය - DMS CM පොදු
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2007.08.01 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් /
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් /
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සහ අයවැය ඇස්තමේන්තුවල අන්තර්ගත සංවර්ධන ව්‍යාපෘතින්හි අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු

1. රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සහ අයවැය ඇස්තමේන්තුවල අන්තර්ගත සංවර්ධන ව්‍යාපෘතින්හි තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් / පත්කිරීම් 2007.08.01 දින සිට මෙම චක්‍රලේඛයට අනුකූලව ඉටු කල හැකිය.

2. මුදල් රෙගුලාසි 71 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුර අනුමත කර ඇත්නම් සහ අයවැය ඇස්තමේන්තු මඟින් වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්ව තිබීම තහවුරු කරගැනීමෙන් පසු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි සඳහන් MN, MT, SL වැටුප් ක්‍රමයන්ට අදාල තනතුරු පුරප්පාඩු සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ / ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ඇතිව බඳවාගැනීම් / පත්කිරීම් කල හැකිය. එසේ බඳවාගැනීම් / පත්කිරීම් කළ යුත්තේ 2006.06.30 දිනට හෝ ඊට පසුව නිලධාරීන් විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම, මියයාම හෝ සේවය අතහැර යාම නිසා ඇතිවූ පුරප්පාඩු සඳහා පමණි.

3. ඉහත 2 ජේදයේ සඳහන් නොවන තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් / පත්කිරීම් වලදී
   2006.04.10 - කළමනාකරණ සේවා චක්‍රලේඛ 28
   2006.05.26 - කළමනාකරණ සේවා චක්‍රලේඛ 28 (I)
   2006.08.01 - කළමනාකරණ සේවා චක්‍රලේඛ 28 (II) හි සඳහන් උපදෙස් පරිදි තවදුරටත් ක්‍රියාකල යුතුය.

4. පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේදී / පත්කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ 28 (II) හි උපදෙස් අනුව ක්‍රියාකළයුතු බව අවධාරනය කරන අතර, ආයතනයේ කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට බඳවාගනු / පත්කරනු ලබන තනතුරු අත්‍යාවශ්‍ය බවට අමාත්‍යාංශ ලේකම්වරයා පෞද්ගලිකව සෑහීමකට පත්විය යුතුය.

5. බඳවාගැනීම් / පත්කිරීම් අනුමත බඳවාගැනීමේ පරිපාටි වලට අනුකූලව සිදුකල යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

6. මේ අනුව බඳවා ගැනීම් හා පත්කිරීම් කරනු ලබන තනතුරු නාම සහ සංඛ්‍යා පිළිබඳ විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට මසක් ඇතුලත ඉදිරිපත් කල යුතුය.

7. මෙම චක්‍රලේඛණය පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍යවේ නම් කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අධ්‍යක්ෂ ගාමිණී ජයසේකර මහතා (දුරකථන අංක - 2484871) හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජගත් ඩයස් මහතා (දුරකථන අංක - 2484758) අමතන ලෙස කාරුණිකව දන්වමි.

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ
ලේකම්

පිටපත් -
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. විගණකාධිපති
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7. ලේකම්, මුදල් කොමිෂන් සභාව